᮪ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2194/55 - 2020 සැප්තැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (3) (අ) (i) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, සබරගමු පළාත් සභාවේ ආණ්ඩුකාර වන ටිකිරි කොබ්බෑකඩුව වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති වන හඳුන්කුට්ටි ජේඩිගේ චන්ද්‍රන කුමාර ජයවන්දල මහතා එකී ධුරයේ රාජකාරි කටයුතු කිරීමේ දී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්ද යන්න සම්බන්ධයෙන් මෙම දැන්වීමේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා, විශ්‍රාමික මහාධිකරණ විනිසුරු, හේරත් මුදියන්සේලාගේ රෝහණ අනුර කුමාර මහතා පත්කරමි.

මෙම විශ්‍රාමික මහාධිකරණ විනිසුරුහට මෙම පරීක්ෂණයට අදාළ පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිසමක බලතල ඇත්තේ ය.

**ටිකිරි කොබ්බෑකඩුව,**
සබරගමු පළාත් ආණ්ඩුකාර.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
රත්නපුර නව නගරයේ පිහිටි,
සබරගමුව පළාතේ ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

10 - 346

1A - PG 005142 — 25 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*